# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2210/18 - 2021 ජනවාරි මස 13 වැනි බදාදා - 2021.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. ඒ. 2232 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2016 අගෝස්තු මස 9 වැනි දින අංක 1979/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ නිශ්චිතව දැක්වෙන "තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) සම්බන්ධයෙන් වන අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමේ දී -

(i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ii) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම.

අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම විය යුතු ය.

2. (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) උඩරට නර්තනය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී (ගෞරව) උපාධිය සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමේදී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කලා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම විය යුතු ය.

3. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

***II වන උපලේඛනය***

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) | බීබීඑම් (ගෞරව) |
| උඩරට නර්තනය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී (ගෞරව) | බීබීඒ ගෞරව (උඩරට නර්තනය) |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

01 - 548

---

එල්.ඩී.බී. 21/1978 (X) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 101137 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/54 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ නිශ්චිතව දැක්වෙන "ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) වලාකුළු පරිගණකකරණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම), මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) සහ

සයිබර් ආරක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) සම්බන්ධයෙන් වන උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා වන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම -

(i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව විෂයය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ii) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම.

විය යුතු ය.

2. සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) සම්බන්ධයෙන් වන උපාධි අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ (එස්) (03) තුනක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.

3. සංගීතවේදී ගෞරව උපාධිය (එස්එල්කිවුඑෆ් 6 වන මට්ටම) යනුවෙන් නම් කරන ලද අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුවකු ඇතුළත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.

4. මේ නියමය පළ කරනු ලබන දින සිට සෑම අවුරුදු පහකට (5) වරක්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වෙන උපාධිය ප්‍රදානය කිරීම සඳහා, නිශ්චිත බලධරයා විසින් විෂය ප්‍රතිසමාලෝචනයක් පවත්වනු ලැබිය යුතු ය.

### *II වන උපලේඛනය*

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (දත්ත විද්‍යා) |
| වලාකුළු පරිගණකකරණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (වලාකුළු පරිගණකකරණ) |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු) |
| සයිබර් ආරක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (සයිබර් ආරක්ෂණ) |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (සිවිල් ඉංජිනේරු) |
| සංගීතවේදී ගෞරව | බීමියුසික් ගෞරව |

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

01 - 549

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.